**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ උකුවෙල ප්‍රාදේශීය සභාව සඳහා පුස්තකාල සහායක/කාර්යාල කාර්යය සහායක තනතුරු සඳහා බඳවා ගැනීම**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ උකුවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (උකුවෙල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

උපලේඛනය

| තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| පුස්තකාල සහායක III පන්තිය | 01 | වැටුප් කේත අංකය PL- 1<br>රා. ප. ච. 3/2016 අනුව වැටුප රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 x 12 -330 - රු. 36.410 රා. ප. ච. 3/2016 හි උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.<br>(හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයන් 02 කට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරක දී සමත්ව තිබිය යුතු ය. |
| කාර්යාල කාර්යය සහායක III පන්තිය | 02 | වැටුප් කේත අංකය PL-1<br>රා. ප. ච. 3/2016 අනුව වැටුප රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 x 12 - 330 - රු. 36.410 රා. ප. ච. 3/2016 හි උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.<br>(හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයන් 02 කට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරක දී සමත්ව තිබිය යුතු ය. |

02. කායික සුදුසුකම් ඃ

සෑම අපේක්ෂකයකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

03. අවශ්‍ය අනෙකුත් සුදුසුකම් ඃ

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියයන් විය යුතු ය.
ii. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 3 ක කාලයක් උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
iii. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් උකුවෙල ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටි ස්ථිර තනතුරු දරන අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
iv. උකුවෙල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.
v. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් සිටිය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
vi. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.

04. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
ii. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දයකත්වය හිමිවේ.
iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
iv. මෙම බඳවාගැනීම් කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද මධ්‍යම පළාත් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

05. *අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන :*

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
ii. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

*(a)* උප්පැන්න සහතිකය;
*(b)* අධ්‍යාපන සහතික;
*(c)* තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතික;
*(d)* මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක්; (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙනි);
*(e)* වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික;
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් නම් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

06. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

07. *අයදුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2017.06.30 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, උකුවෙල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය උකුවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්. ජේ. එන් ජයසිංහ,
ලේකම්,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2017 මැයි මස 08 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභා කාර්යාලය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***උකුවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පවතින ........................................ තනතුර සඳහා බඳවා ගැනීම***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
02. මුලකුරු සමග නම :——————————.
03. ස්ථිර ලිපිනය :——————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
05. උපන් දිනය : වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :——————————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

08. විවාහක/අවිවාහක බව :——————————.

09. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.

11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න) :

අ.පො.ස. (සා. පෙළ) විභාගය :

සමත් වර්ෂය : විභාග අංකය :

| අනු. අංකය | විෂය | සාමාර්ථය | අනු. අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6 | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10 | | |

අ.පො.ස. (උ/පෙළ) විභාගය :

සමත් වර්ෂය : විභාග අංකය :

| අනු. අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

12. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :——————————.

13. වෘත්තීය සුදුසුකම් :

i. සේවා පළපුරුද්ද :——————————.
ii. දැනට සේවය කරන ආයතනය :——————————.
iii. දැනට දරන තනතුර :——————————.
iv. එම තනතුරට පත් වූ දිනය :——————————.
v. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————.

14. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්

*(a)* දැනට දරන තනතුර :——————————.
*(b)* ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්, ආදේශක යන වග ද :——————————.
*(c)* එම තනතුරට පත් වූ දිනය :——————————.

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :——————————.

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

## දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

.................................. මයා/මිය/මෙනෙවිය මෙම ආයතනයේ ............................. වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

____________________.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :________________.